**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.1 තත්ත්වාගණනය කළ මතය.**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ළමා ආරක්ෂක අරමුදලේ ලැබීම් හා ගෙවීම් සඳහා වෙනම අරමුදල් ගිණුමක් පවත්වා නොතිබුණු අතර අධිකාරියේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය යටතේම ගිණුම්ගත කර තිබුණි.

(ආ) අධිකාරියට 2011 වර්ෂයේ දී ලැබුණු රු.17,450,000 වටිනා මෝටර් රථ දෙක 2011 වර්ෂයේ දී ගිණුම්ගත නොකර 2012 වර්ෂයේ දී ගිණුම්ගත කර තිබුණි. 2011 වර්ෂයේ දී මෝටර් රථවලට අදාළ වාර්ෂික ක්ෂය රු.1,745,000ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා සමුච්චිත ක්ෂය වෙන් කිරීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සේවක පාරිතෝෂිත ලෙස රු.50,025ක මුදලක් නිලධාරියෙකුට ගෙවා තිබු අතර එය සේවක පාරිතෝෂිත ආයෝජනවලින් ඉවත් කොට මුදල් පොතට මාරු කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති දෙකක් යටතේ පැවති එකතුව රු.2,510,672ක් වූ වත්කම් සියයට 100 කින් ක්ෂය කර තිබුණද, එම වත්කම් භාවිතයේ පවතින බැවින් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.2.2 <u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(i)** 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | 2009, 2010 හා 2011 වර්ෂ වෙනුවෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| **(ii)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| මු.රෙ. 371 | අධිකාරියේ නිලධාරීන්ට ලබා දුන් අත්තිකාරම් මුදල් වලින් රු.4,292,914ක මුදලක් 2012 දෙසැම්බර් 31 දින වනවිට නිරවුල් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.20,000 ක සීමාව ඉක්මවා රු.226,000 ක් දක්වා අත්තිකාරම් ලබා ගත් අවස්ථා 109ක් නිරීක්ෂණය විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ඉතිරි මුදල පියවීමට දිගු කලක් ගතවන බව සභාපතිවරිය 2013 ඔක්තෝබර් 29 දිනැති ලිපියෙන් දැනුම් දී තිබුණි. |
| මු.රෙ.1646 | අධිකාරිය සතු වාහන 19 ක් සම්බන්ධයෙන් වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. |

**2. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵල.</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.11,428,602 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂය සඳහා

අතිරික්තය රු.6,826,677ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.18,255,279ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන හේතූන් ලෙස ජාතික සැලැසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් 2012 වර්ෂය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන රු.4,810,000කින් අඩුවීම, වෙනත් ඒජන්සි ආයතනවලින් ලැබීම් රු.9,794,019කින් අඩුවීම හා පුද්ගල පඩිනඩි ගෙවීම් රු.7,093,319කින් වැඩිවීම ද හේතුවී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 වර්ෂයේ ශුද්ධ වත්කම්වල වටිනාකම රු.112,277,411ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු.84,321,565 හා සැසඳීමේදී රු.27,955,846ක් හෙවත් සියයට 24 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.15,548,563ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.12,608,539 හා සැසඳීමේදී රු.2,940,024ක් හෙවත් සියයට 23 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 කාර්ය සාධනය

**3.1.1** සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි හා ඒවා නියාමනය කිරීම් කාර්ය සාධනය පහත පරිදි විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ නීති අංශයට ලැබුණු පැමිණිලි 2549න් 76ක පමණක් නියාමන කටයුතු අවසන් කර තිබුණු අතර පැමිණිලි 2473 නියාමන කටයුතු කෙරෙමින් පැවතුණි.

(ආ) අධිකාරියේ පොලිස් ඒකකයට සමාලෝචිත වර්ෂයේදී පැමිණිලි 4010ක් ලැබී තිබූ අතර විමර්ශන අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව 34කි. බැහැර පොලිස් ස්ථානවලට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 3976ක් වූ අතර එම පොලිස් ස්ථාන වලින් පිළිතුරු නොලද පැමිණිලි සංඛ්‍යාව 635ක් විය.

(ඇ) මනෝ සමාජීය ඒකකය වෙත ලැබුණු පැමිණිලි 1405න් පැමිණිලි 278කට පමණක් උපදේශන ලබා දී අවසන් කර තිබුණි.

**3.1.2** සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන්/ ව්‍යාපෘති 14ක් සැලසුම් කර තිබුණු අතර ඉලක්කයන් කරා ලඟාවීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) පහත සඳහන් වැඩසටහන් මූල්‍යමය වශයෙන් සැලැසුම් කර තිබූ නමුත් පවත්වනු ලබන වැඩසටහන් ප්‍රමාණය තීරණය කර නොතිබුණි. එම කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි විය.

(i) සුනාමි වැඩසටහන් සඳහා රු.228,000ක් වෙන්කර තිබුණු අතර රු.337,000 වැය කර රැස්වීම් 08ක් පවත්වා තිබුණි.

(ii) ළමා ආරක්ෂක උපකරණ මිලදී ගැනීම සඳහා රු. 910,000 වැය කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා රු.581,000ක් වැය කර තිබුණි.

(ii) ළමා දින/ කාන්තා දිනයන්වලදී දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විම සඳහා රු.1,638,000 වෙන් කර තිබූ අතර රු.1,738,000 වැය කර වැඩසටහන් 49ක් පවත්වා තිබුණි.

(ආ) වීඩියෝ පටිගත කිරීමේ ඒකකය යාවත්කාලීන කිරිම සඳහා රු.455,000 වෙන්කර තිබූ අතර රු.216,000 වැය කර එම ඒකකය සඳහා වැඩමුළු 02ක් පවත්වා උපකරණ මිලදීගෙන තිබුණි.

### 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා.</u>

අනුරාධපුර දිස්ත්‍රික්කයේ "සුරැකි පියස" ළමා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ඉඩමක් තෝරාගෙන තිබුණ අතර එය පවරා ගැනීමකින් තොරව මායිම් වැට ඉදිකිරීම සඳහා රු.258,018ක මුදලක් මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබුණි. ඉඩම් ආරවුලක් හේතුවෙන් අදාළ කාර්යය සඳහා එය යොදා ගැනීමට නොහැකි වුවද වැට සකස් කිරීමට යැවූ මුදල ගෙන්වා ගැනීමට නොහැකි වී තිබුණි.

### 3.3 <u>අරමුදල් ඌන උපයෝජනය.</u>

අධිකාරියේ තාප්පය ඉදිකිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට 2011 වර්ෂයේ දී ගෙවා තිබුණු රු.2,222,000ක මුදල එම ආයතනයෙන් නැවත ලබාගෙන ළමා ආරක්ෂක අරමුදල් ගිණුමේ තැන්පත් කර තිබුණි.

### 3.4 <u>ප්‍රමාණවත් ලෙස ඉටුනොවූ අරමුණු.</u>

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14 වගන්තියේ දැක්වෙන අරමුණුවලට අනුකූලව ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීම මාස 03ක් ඇතුළත නිම කිරීමට 2009 ජනවාරි 06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී අධිකාරිය වෙත නියෝග කර තිබුණි. "ළමුන්ට එරෙහි සියලු ආකාරයේ අපයෝජන, ප්‍රචණ්ඩත්වය හා සූරාකෑමෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය" මැයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකසා අමාත්‍ය මණ්ඩලය වෙත 2012 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 4. <u>ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය.</u>

### 4.1 <u>සංයුක්ත සැලැස්ම.</u>

අධිකාරියේ කාර්යභාරය සම්බන්ධව වර්ෂ 2007-2012 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ අඩංගු එක් එක් වැඩසටහනේ ප්‍රතිලාභ ලබා කර ගැනීමේ ඉලක්ක වෙනුවෙන් නිශ්චිත කාලවකවානු හඳුනාගෙන නොතිබුණි.

### 4.2 <u>ක්‍රියාකාරී සැලැස්ම.</u>

සංයුක්ත සැලැස්මේ පිළිගත් අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනිමේ නිශ්චිත කාලවකවානු හඳුනාගෙන නොතිබීම නිසා එහි ප්‍රගතිය කාලානුරූපව පරික්ෂා කිරීමට නොහැකි විය.

### 4.3 <u>විගණන කමිටු.</u>

අධිකාරිය විසින් 2012 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් වාර 02ක් පවත්වා තිබුණි.

## 5. <u>පද්ධති හා පාලන.</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් ගෙවීම

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීම